# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,680 - 2010 නොවැම්බර් මස 12 වැනි සිකුරාදා - 2010.11.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1974 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1978 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 නොවැම්බර් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 නොවැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකූත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ :-

01. ඉල්ලුම්කරුවන් අදාල විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය;

02. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය;

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 65ට නොවැඩි විය යුතුය;

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය;

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලා ගත හැකිය;

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත හැක;

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 දෙසැම්බර් මස 13 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ඔක්තෝබර් මස 26 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මහනුවර | අකුරණ | මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව රඹුක්කේඇල කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | අකුරණ | මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව කොට්ඨාසයේ මල්වාහින්නගම ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

11-288

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ :-

01. ඉල්ලුම්කරුවන් අදාල විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය;

02. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය;

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 65ට නොවැඩි විය යුතුය;

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය;

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලා ගත හැකිය;

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත හැක;

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 දෙසැම්බර් මස 13 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ඔක්තෝබර් මස 26 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මහනුවර | හාරිස්පත්තුව | මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව කොට්ඨාසයේ උගුරැස්සපිටිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

11-286

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව - නිලධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පරිපාලන නීති ශාඛාවෙහි ඉදුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීමට පිරිමි/කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

*පරිපාලන නීති ශාඛාව* :
ප්‍රධාන නීති නිලධාරි - නිත්‍ය/ස්වේච්ඡා
නීතිවේදී උපාධිය සහිතව ක්‍රියාකාරී නීතිඥයෙකු ලෙස අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද තිබීම.

3. *අනෙකුත් සුදුසුකම්* :

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය |
| (ආ) | සිවිල් තත්වය | : විවාහක/අවිවාහක |
| (ඇ) | ස්ත්‍රී පුරුෂ භාවය | : පිරිමි/කාන්තා |
| (ඈ) | වයස | : 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| (ඉ) | උස | : පිරිමි - අඩි 5 අඟල් 5ක් හෝ ඊට වැඩි විය යුතුය.<br>කාන්තා - අඩි 5 අඟල් 4 හෝ ඊට වැඩි විය යුතුය. |
| (ඊ) | පපුව | : අඟල් 32ට නොඅඩු විය යුතුයි (පිරිමි) |
| (උ) | දෘෂ්ඨි තීක්ෂණත්වය | : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහිතව හෝ රහිතව) |

4. යම් අයැදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ට දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා අවශ්‍යතා* : තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාවේ විංග් කමාන්ඩර් හෝ ග්‍රෲප් කැප්ටන් යන නිලයෙහි නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියට පත්කරනු ලැබේ.

9. තෝරා ගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේ ය.

10. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

11. 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10, 240 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව අදාල නිලයේ නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව "සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක." කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේනම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ II වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

12. ගුවන් හමුදා නිලධාරින් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

13. අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහ භාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවයද සපයනු ලැබේ. අවිවාහක නිලධාරින්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

14. විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15 (ආ) (16) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

15\. (අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විංග් කමාන්ඩර් සහ ග්‍රෲප් කැප්ටන් යන නිලයන්ට අයත් අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ. :-

විංග් කමාන්ඩර් - රු. 362,100 - 20 x 9,480 = රු. 551,700 වසරකට
ග්‍රෲප් කැප්ටන් - රු. 441,060 - 18 x 12,600 = රු. 667,860 වසරකට

(ආ) අනෙකුත් දීමනා :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 5,250 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250 ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට රු. 5,000ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,000ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 100.00 බැගින් ගෙවනු ලැබේ.)
(6) අතිරේක දීමනාව මසකට රු. 1,000 ගෙවනු ලැබේ.
(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255ක් ගෙවනු ලැබේ.
(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා)
(9) ආහාර දීමනාව මසකට රු. 10,609.75ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා)
(10) සුදුසුකම් වේතනය අදාල පරිදි (මසකට උපරිමය රු. 637.50ක්) ගෙවනු ලැබේ.
(11) නොමිලේ ගමන් කළහැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/බිරිඳ/සහ දරුවන්ට) දෙනු ලැබේ.
(12) කඳවුර තුල වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(13) නිල ඇඳුම් හා ඊට අදාල අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(14) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදාල පරිදි)
(15) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30ක් තුල රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
(16) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමිවේ. ගෲප් කැප්ටන් සහ ඊට ඉහල නිලයන් සඳහා මසකට - රු. 1,850 සිට රු. 4,250 දක්වා.

16. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.*-විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. *ඉල්ලුම්කරුවන්ට උපදෙස් :*

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2010 නොවැම්බර් මස 19 වැනි දින මධ්‍යාහ්න 12.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ "ප්‍රධාන ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරී, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ "ප්‍රධාන නීති නිලධාරී තනතුර සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයැදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම්දිය යුතුය.

(ඇ) ඉල්ලුම්පත් සමග අයැදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත්වල පිටපත් ඉදිරිපත් කළ යුතුය :-

(1) උප්පැන්න සහතිකය,
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික,
(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික,
(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදී සනාථ කරන සහතික,
(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

**සැලකිය යුතුයි.*—මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේදී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමට ද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

19. *තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :*

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයැදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයැදුම්කරුවන්ට ගුවන් හමුදාපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේ ය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයැදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

(ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක)
එයාර් චීෆ් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පරිපාලන නීති ශාඛාවේ ප්‍රධාන නීති නිලධාරී තනතුර සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ඉල්ලුම් කරන තනතුර :————.

5. ස්ථිර ලිපිනය :————.

6. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

7. තැපැල් ලිපිනය :————.

8. උපන් දිනය :————.

9. උස : අඩි :————. අඟල් :————.

10. දිස්ත්‍රික්කය :————.

11. ඡන්ද කොට්ඨාසය :————.

12. ග්‍රාම සේවක කොට්ඨාසය :————.

13. දුරකථන අංකය :————.

14. විවාහක හෝ අවිවාහක බව :————.

15. පාසල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ/ විශ්වවිද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ. පො. ස. (සා. පෙළ) : | | |
| | අ. පො. ස. (උ. පෙළ) : | | |
| | වෘත්තීය සුදුසුකම් : | | |
| | වෙනත් : | | |

16. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :

| සේවායෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

17. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැන් ලිපිනය |
|---|---|---|---|
| පියා :————.<br>මව :————. | | | |

18. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

19. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

20. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමඟ විස්තර දක්වන්න.) :————.

21. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

22. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීන් පෙර ඉල්ලුම් කර තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

23. සිවිල් හෝ යුද්ධ උසාවියක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

24. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු. :————.

25. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

26. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11-181

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - කොළඹ දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් අංක 1670 හා 2010.09.03 දිනැති *ගැසට් නිවේදනයේ* පළකළ ඉහත දැන්වීමට අදාළව 1675 හා 2010.10.08 දින දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධන දැන්වීමෙන් සංශෝධිත තනතුර වන "කොළඹ කොට්ඨාසයේ රත්මලාන ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය" යන්න "කොළඹ කොට්ඨාසයේ (බටහිර රත්මලාන) විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය" යනුවෙන් නැවත සංශෝධනය කිරීම.

02. එසේම මෙම සංශෝධිත තනතුරට පමණක් බලපැවැත්වෙන පරිදි අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2010.12.13 ලෙස සංශෝධනය කරනු ලැබේ.

03. 1670 හා 2010.09.03 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ල එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ක් වූ ඔක්තෝබර් මස 21 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11-229

## නිවැරදි කිරීමයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාල අධිකාරි තනතුරට බඳවා ගැනීම

2010.10.29 වැනි දින සාමාන්‍ය ගැසට් පත්‍රයේ I කොටස (IIඅ) වැනි ඡේදයේ අංක 10/983 දරන දැන්වීමේ ඉහත මාතෘකාව යටතේ අංක 4 අයදුම්කිරීමේ ක්‍රමය යටතේ අනු අංක VI වගන්තිය පහත අයුරින් සංශෝධනය විය යුතු ය.

(VI) මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නියමය පරිදි,

විභාග කොමසාරිස් ජනරාල්.

2010 ක් වූ නොවැම්බර් මස 03 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

11-525

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**යෞවන කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - රත්මලාන**

***2011 අධ්‍යයන වර්ෂය සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම***

පහත දැක්වෙන පාඨමාලා සඳහා ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| *පාඨ. අං.* | *පාඨමාලාව (පූර්ණ කාලීන)* | *NVQ/ Non NVQ* | *පුහුණුව මාස ආයතනික* | *පුහුණුව මාස වැඩ බිම්* | *පාඨමාලා ගාස්තුව රු. ශත* |
|---|---|---|---|---|---|
| 01 | මෝටර් කාර්මික (Auto Motive) | NVQ L4 | 12 | 12 | 6,000 0 |
| 02 | මෝටර් රථ විදුලි කාර්මික (Automobile Electrician) | NVQ L3 | 12 | 12 | 2,000 0 |
| 03 | පෑස්සුම් ශිල්පී (Welder) | NVQ L4 | 12 | 12 | 2,500 0 |
| 04 | යන්ත්‍ර ශිල්පී (Machinist) | NVQ L3 | 12 | 12 | 3,000 0 |
| 05 | ගුවන් විදුලි හා රූපවාහිනී ආශ්‍රිත උපකරණ කාර්මික (Radio, TV and Allied Equipment Repairer) | NVQ L4 | 18 | 12 | 3,000 0 |
| 06 | වඩු කාර්මික (ගෘහ භාණ්ඩ) (Carpenter Furnisher) | NVQ L4 | 12 | 12 | නොමිලේ |
| 07 | කර්මාන්ත ශාලා උපකරණ කාර්මික ශිල්පී Industrial Instrument Technician (Industrial control, Instrumentation and Automation/PLC Base) | Non NVQ | 12 | 12 | 5,000 0 |
| 08 | විදුලි ශිල්පී (Electrician) | NVQ L3 | 12 | 12 | 2,500 0 |
| 09 | ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පී (Ref. and Air Conditioning Mechanic) | NVQ L3 | 12 | 12 | 3,000 0 |
| 10 | ඉදිකිරීම් හා ජලනල කාර්මික (Construction & Plumbing) | NVQ L4 | 12 | 12 | නොමිලේ |
| 11 | මෝටර් රථ වැද්දුම් ශිල්පී (ටිංකරින්) (Tinkering) | NVQ L3 | 06 | 06 | නොමිලේ |
| 12 | ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික (Aluminum Fabricator) | NVQ L3 | 06 | 06 | 2,000 0 |

| පාඨ. අං. | පාඨමාලාව (පූර්ණ කාලීන) | NVQ/ Non NVQ | පුහුණුව මාස ආයතනික | වැඩ බිම් | පාඨමාලා ගාස්තුව රු. ශත |
|---|---|---|---|---|---|
| 13 | පරිගණක යෙදුම් සහායක (Computer Application Assistant) | NVQ L3 | 06 | 06 | 4,000 0 |
| 14 | පරිගණක දෘඩාංග ශිල්පී (Computer Hard-wear Technician) | NVQ L3 | 06 | 06 | 10,000 0 |
| 15 | තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව (NCICT) | Non NVQ | 06 | 06 | 6,000 0 |
| 16 | ජංගම දුරකථන අළුත්වැඩියා කරන්නා (Mobile Phone Repairer) | Non NVQ | 06 | 06 | 10,000 0 |
| 17 | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී (Computer Graphic Designer) | NVQ L3 | 06 | 06 | 8,000 0 |
| 18 | ප්‍රමාණ සමීක්ෂක (Quantity Surveyor) | Certificate | 06 | 06 | 20,000 0 |

පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම්.—

* අයදුම්පත් ඉදිරිපත් කිරීමේ වයස් සීමාව අවුරුදු 16 - 30 අතර වේ.

*අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

* පාඨමාලා අංක 01, 02, 04, 08, 09, 14, 16, 17 සඳහා අ. පො. ස. (සා. පෙ.) විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතුය.
* පාඨමාලා අංක 18 සඳහා අ. පො. ස. (උ. පෙ.) විෂයයන් 02 න් සමත්වීම
* පාඨමාලා අංක 03 සඳහා අ. පො. ස. (සා. පෙ.) විෂයයන් 03 කින් සමත්ව තිබිය යුතුය.
* පාඨමාලා අංක 05 සහ 07 සඳහා අ. පො. ස. (සා. පෙ.) විද්‍යාව හා ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතුය.
* පාඨමාලා අංක 13 සඳහා අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතුය.
* පාඨමාලා අංක 15 සඳහා අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය විෂයන්ට සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම.
* අනෙකුත් සියලුම පාඨමාලා සඳහා අ. පො. ස. (සා. පෙ.) පෙනී සිටීම හෝ 9 ශ්‍රේණිය සමත්වීම වුව ද ප්‍රමාණවත් වේ.
* අපේක්ෂකයාගේ දැනුම, ආකල්ප හා කුසලතා පදනම් කර ගෙන ඒ ඒ පාඨමාලා සඳහා අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කිරීම ද සලකා බලනු ලැබේ.

*ඉහත පාඨමාලා හදාරණ ඔබට/ඔබේ දරුවාට පුහුණු කාලය තුළ ලැබෙන පහසුකම් :*

* දුෂ්කර දුර බැහැර පෙදෙස්වල ආධුනිකයින් සඳහා නේවාසික පහසුකම්;
* රැකියා ලොව ඉහළ පිළිගැනීමට ලක් වූ ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය නිපුණතා සහතිකය ( NVQ Level);
* වෘත්තීය මාර්ගෝපදේශනය සහ ව්‍යවසායකත්ව දැනුම;
* ස්වයං රැකියා ආරම්භ කරන්නන් සඳහා ණය පහසුකම්;
* සහනදායි මිලට ලංගම මගී වාර ප්‍රවේශ පත්‍ර;
* නායකත්ව හා සෞඛ්‍ය පුහුණු වැඩසටහන්;
* සෑම පාඨමාලාවකටම නොමිලේ ඉංග්‍රීසි අධ්‍යාපනය.

***විශේෂයි :***

* පුහුණුවෙන් පසු අනිවාර්යෙන්ම රැකියාවක්;
* කාර්මික පාඨමාලාවන් සඳහා කාන්තා අයදුම්කාරියන්ට ප්‍රමුඛත්වය;
* දුර බැහැර පෙදෙස්වල අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය.

*පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම :—*

* ඔබ හැදෑරීමට කැමති පාඨමාලාව සඳහන් කර ඔබේ පෞද්ගලික තොරතුරු, දක්ෂතා, රුචිකත්වයන් ඇතුළත් කර ඔබ විසින්ම සකස් කරන ලද අයදුම්පතක් 2010.12.15 වැනි දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න :

සහකාර අධ්‍යක්ෂ,<br>
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,<br>
අංක 100,<br>
කඳවල පාර,<br>
රත්මලාන.

දුරකතන අංක : 011-2638850.

සභාපති,<br>
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

"ජීවිතයට හැකියාවක් - හැකියාවට රැකියාවක්"

11-309

## රජයේ භාෂා පරිවර්තක සේවයේ I වැනි පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010

1994.07.26 වැනි දිනැති අංක 829/7 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද භාෂා පරිවර්තක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි ඡේදය යටතේ සළසා ඇති විධිවිධාන මත භාෂා පරිවර්තක සේවයේ I වැනි පන්තියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2011 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ලබන අතර මෙම විභාගයට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් ඉදිරිපත් විය හැකි ය. විභාගය සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කරනු ලබන අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2010 දෙසැම්බර් මස 13 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

03. (i) අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.10 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන අයදුම්පත්‍රය 8" x 12" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙළ කරගත යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද, එය අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් ම පිළියෙළ කළ යුතු අතර ඒවා එම භාෂාවෙන් ම පිරවිය යුතු ය. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න.

04. *විෂය නිර්දේශය හා විභාග පරිපාටිය* :

*පළමුවන විෂයය* : ප්‍රශ්න පත්‍ර අංක 01-

(i) පොදු වැදගත්කමක් ඇති පාඨයකින්;

(ii) (අ) නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක්; සහ
(ආ) පුවත්පත් ලිපියකින් හෝ වාර්තාවකින් උපුටාගත් කොටසක්;

අයදුම්කරුවන් තම භාෂා පරිවර්තන මාධ්‍යයන් අනුව තෝරා ගත් පහත සඳහන් ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම. :-

(i) සිංහලෙන් දෙමළ බසට;
(ii) සිංහලෙන් ඉංග්‍රීසියට;
(iii) දෙමළ බසින් ඉංග්‍රීසියට.

ලකුණු 100 යි - පැය 3 ක ප්‍රශ්න පත්‍ර එකකි.

*දෙවන විෂයය* :- ප්‍රශ්න පත්‍ර අංක 02

(i) පොදු වැදගත් කමක් ඇති පාඨයකින්;
(ii) (අ) නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක්; සහ

(ආ) පුවත් පත් ලිපියකින් හෝ වාර්තාවකින් උපුටාගත් කොටසක්

අයදුම්කරුවන් තම භාෂා පරිවර්තන මාධ්‍යයන් අනුව තෝරා ගත් පහත සඳහන් ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම. :-

(i) දෙමළ බසින් සිංහලට;
(ii) ඉංග්‍රීසියෙන් සිංහලට;
(iii) ඉංග්‍රීසියෙන් දෙමළ බසට.

ලකුණු 100 යි - පැය 03 ක ප්‍රශ්න පත්‍ර එකකි.

* සාමාර්ථ්‍යය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් ලකුණු සියයට හතළිහක් (40%) ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුය.

05. අපේක්ෂකයන්ගේ අත්අකුරු පිළිබඳව සැළකිල්ලක් දක්වනු ලැබේ.

06. *විභාග ගාස්තු*.—

මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් වෙනුවෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කරනු ලැබේ. :—

(අ) පළමු වන වතාව සඳහා ගාස්තු අය නොකෙරේ;

(ආ) ඉන්පසු එක් වතාවක් සම්පූර්ණ විභාගය සඳහා රුපියල් 400 කි. එක් විෂයයක් සඳහා රුපියල් 200 කි;

(ඉ) විභාග ගාස්තුව, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් ලදුපතක් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. එම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය;

(ඊ) කුමන කරුණක් යටතේ වුව ද මෙම විභාග ගාස්තුව ආපසු ගෙවීමක් හෝ වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ.

07. *විභාගයට ඇතුළත් කර ගැනීම* .—

(i) අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අපේක්ෂකයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ ප්‍රවේශපත්‍ර අත්සන සහතික කරවා ගෙන ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශපත්‍ර නොමැතිව ඔවුන්ට විභාග ශාලාවට ඇතුළු වීමට හෝ විභාගයට පෙනී සිටීමට හෝ අවසර නොදෙනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා අදාළ නම් මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපතක් ද,

දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) එක් එක් අපේක්ෂකයා වෙත ප්‍රවේශ පත්‍රය සමග කාල සටහනක් ද නිකුත් කරනු ලැබේ.

(iii) විභාග පැවැත්වීම පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවා ඇති නීතිරීතිවලට අපේක්ෂකයන් බැඳී සිටිය යුතු ය. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

(iv) අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති රීති මෙම ගැසට් පත්‍රය ආරම්භයේ මුද්‍රණය කර ඇත.

සටහන : අයදුම්කරුවෙකු වෙත විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබීම, මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා අයදුම්කරු සපුරාලිය යුතු සුදුසුකම් පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

08. විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කර ඇති විභාග අපේක්ෂකයන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

09. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාව.*—අපේක්ෂකයන්/අපේක්ෂිකාවන්, විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

තම ප්‍රවේශ පත්‍රයට අමතරව ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2010 ඔක්තෝබර් මස 27 වැනි දින,
ඒකාබද්ධ සේවා අංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

[ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**රජයේ භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010**

Efficiency Bar Examination For Officers in Class I of the Government Translators' Service - 2010

(*සැළකිය යුතුයි* : මෙම ආකෘති පත්‍රය නිවැරදිව හා පැහැදිලිව අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම පිරවිය යුතුයි.)

1.0 *ගැසට් නිවේදනයේ 04 වන ඡේදය අනුව ඔබ පරිවර්තනයෙහි යෙදෙන ආකාරය* :

ප්‍රශ්න පත්‍ර අංක 01 : සිංහලෙන් දෙමළ බසට - 1
සිංහලෙන් ඉංග්‍රීසි බසට - 2
දෙමළ බසින් ඉංග්‍රීසියට - 3 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ප්‍රශ්න පත්‍ර අංක 02 : දෙමළ බසින් සිංහලට - 4
ඉංග්‍රීසියෙන් සිංහලට - 5
ඉංග්‍රීසියෙන් දෙමළ බසට - 6 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

* ප්‍රශ්න පත්‍ර අංක 01 ට හෝ ප්‍රශ්න පත්‍ර අංක 02 ට හෝ එම ප්‍රශ්න පත්‍ර දෙකටම හෝ පෙනී සිටිය හැකිය.

2.0 *පෞද්ගලික තොරතුරු* :

2.1 මුලකුරු අගට යොදා මුල´කුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————. [*උදාහරණ* : SILVA, A. B.]

2.2 මුල´කුරුවලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :——————.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ නම :————.

2.5 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශපත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.6 ස්ත්‍රී/පුරුෂ බව (ස්ත්‍රී -1/පුරුෂ - 0) [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.7 උපන් දිනය :-

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

2.8 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2.9 දැනට දරන තනතුර :————.

2.10 පත්වීම් ලිපියේ අංකය :————.

3.0 3.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

3.2 එසේ නොවේ නම්, විභාග ගාස්තු ගෙවා ලබාගත් (අමුණා ඇති) මුදල් භාරගැනීමේ ලදුපත් අංකය :————.

දිනය :————.

නිකුත් කළ තැපැල් කාර්යාලය :————.

| |
|---|
| එක් විෂයයක් සඳහා රු. 200 ක් ද, සම්පූර්ණ විභාගය සඳහා රු. 400 ක් ද ගෙවා ඕනෑම තැපැල් කාර්යාලයකින් ලබා ගත් මුදල් භාරගැනීමේ ලදුපත මෙහි ඇලවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.) |

4.0 *අයදුම්කරුගේ සහතිකය* :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම අයදුම්පත්‍රය ආරම්භයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්, මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීතිරීති පිළිපැදීමට ද එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

5.0 *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

(i) මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ භාෂා පරිවර්තකයකු බව ද,

(ii) ඉහත සපයා ඇති විස්තර නිවැරදි බව ද,

(iii) ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සෑම විටම සතුටුදායක බව ද, පසුගිය පස් අවුරුදු කාලසීමාව තුළ (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට භාජනය නොවූ බව ද,

(iv) ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද,

(v) නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් (අදාළ නොවේ නම් කපා හරින්න)
මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

පදවි නාමය :————;

ලිපිනය :————;

දිනය :————.

11-299

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය ඖෂධවේදී පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම - 2010 වර්ෂය**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවාවේ ඖෂධවේදී පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 2007, 2008 වසරවල අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී ලබා ගන්නා ලද Z අගය අනුව ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කර ගනිමින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

02. පුහුණු පාඨමාලාවට බඳවාගත හැකි සංඛ්‍යාව අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාතය පදනම් කර ගනිමින් සිසුන් පාඨමාලාවන් සඳහා තෝරා ගනු ලැබේ.

03. i. මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් බැවින්, සතියේ දින 5 සහ සෙනසුරාදා පෙරවරුවේ වෙනත් පාඨමාලාවන් හදාරන සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් නොකල යුතුයි.

ii. කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්ව විද්‍යාලයක පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම් අයදුම්පත් ඉදිරිපත් කල යුතු අවසන් දින වන විට ඔබ විසින් එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතුය. (ඔබ විශ්ව විද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි වී නොමැති/නොවන අයෙක් වුවද ඔබ විශ්ව විද්‍යාල සිසුවෙකු සේ සලකනු ලබන බැවින්, එවන් අයදුම්කරුවන්ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතුය.)

iii. ඔබ යම් විශ්ව විද්‍යාලයක උපාධිය සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දිනය (Effective Date) අයදුම්පත් ඉදිරිපත් කල යුතු අවසන් දිනට පෙර දිනයක් විය යුතුය.

*සැළකිය යුතුය* :-

ඉහත 03. II හා/හෝ 03. III අනුව, ඔබ විසින් විශ්ව විද්‍යාල ලියාපදිංචිය අවලංගු කර ගන්නේ නම් හෝ දැනට උපාධිය සම්පූර්ණ කර සිටීනම් හෝ අනිවාර්යයෙන්ම ඔබ ඖෂධවේදී පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම ගැසට් නිවේදනයේ කුමන හෝ වගන්තියක් මගින් අදහස් **නොකෙරෙන** බව ඔබ තරයේ සිහි තබාගත යුතුය.

එසේ ලියාපදිංචිය අවලංගු කරගෙන හෝ උපාධිය සම්පූර්ණ කර හෝ තිබෙන නමුත් ප්‍රමාණවත් Z අගයක් ඔබ විසින් ලබාගෙන නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ විසින් දැනගත යුතුය.

එමෙන්ම, ඔබ විසින් ප්‍රමාණවත් Z අගයක් ලබාගෙන ඇති නමුත් ඉහත 03. I, 03. II සහ 03. III යන වගන්තිවල සඳහන් කරුණු ඔබ විසින් සම්පූර්ණ කිරීමට අසමත් වන්නේ නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලව සඳහා ඔබ සුදුසුකම් නොලබන බවද ඔබ විසින් තවදුරටත් දැනගත යුතු ය.

04. අදාළ පාඨමාලාව සහ පුහුණු කාලය වසර දෙකකි.

05. *අධ්‍යාපන සුදුසුකම්* :—

05.1 සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර

ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම.

05.2 2007, 2008 වසරවල අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයන් දෙකක් එකවර සමත්වීම. අයදුම්පතෙහි අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z අගය ඇතුළත් කිරීම අනිවාර්ය වේ.

06. *අනෙකුත් සුදුසුකම්.—*

(අ) 2010.12.15 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.
(ඇ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.
(ඈ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතුය.

07. *අයදුම් කළ යුතු ක්‍රමය.—*

(අ) මේ සමඟ ඇති ආකෘතිපත්‍රය අනුව අයදුම්පතක් සකස් කර ගත යුතු වේ. මේ සමඟ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යාංශය, ''සුවසිරිපාය,'' 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ - 10 නමින් කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි මුදල් ඇණවුමක් (Money Order) මඟින් රුපියල් 200ක ගාස්තුවක් සෑම අපේක්ෂකයෙකු විසින්ම ගෙවිය යුතුය. මුදල් ඇණවුම අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතු අතර, එම මුදල කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360 කට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතු වේ.

(ඇ) අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුරු නාමය සඳහන් කොට 2010.12.15 වැනි දින හෝ ඊට පෙර ලැබෙනසේ "අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08. රජයේ හෝ අර්ධ රජයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතු ය.

09. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

10. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

11. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. ඉහත අධ්‍යාපන සහ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂක/ අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය සහතික මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) *උප්පැන්න සහතිකය;*

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික හෝ සහතික නිකුත්කර නැති විට බාහිර අයදුම්කරුවන්ට නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ හෝ අයදුම්කරු විභාගයට පෙනීසිටි විදුහලේ විදුහල්පතිවරයා විසින් නිකුත් කළ මුල් ලිපිය යනාදී ලිපි ලේඛන;

(ඇ) විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ. පො. ස. (උ. පෙළ) Z ලකුණු සහතිකය;

(ඈ) ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය;

(ඉ) දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03 කට පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාමසේවා නිලධාරියාගෙන් ලබාගත් පදිංචිය පිළිබඳව සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

13. *පුහුණු කිරීමේ පටිපාටිය.—*

(i) තෝරාගත් අයදුම්කරුවන් ඖෂධවේදී පාඨමාලාව සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතු වේ.

(ii) පුහුණුව සඳහා ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසැල්වල බල පැවැත්වෙන නීතිරීති වලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලටද යටත් වනු ඇත.

(iii) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ තමන් ඇතුළත් කරගනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

(iv) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(v) පුහුණු පාසලට ඇතුළත්වන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව, පත්වීම් ලැබුණහොත් අවම වශයෙන් අවුරුදු 10ක කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් ඉහත III ඡේදය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් පුහුණු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව හා රජය විසින් දරන ලද වියහියදම් සඳහා වැය වූ මුදල ඔහු/ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. එසේ නොවුවහොත් ගිවිසුමේ ප්‍රකාරව එම මුදල් අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

14. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්.—*පුහුණුව අවසානයේදී ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමටද රජය බැඳී නොසිටී. එහෙත් දිවයිනේ ඕනෑම පළාතක ඇති වන පුරප්පාඩු මත අවසන් පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දෙපාර්තමේන්තුව මඟින් ඔවුන් ලබා ඇති කුසලතාවය පදනම් කරගනිමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු ඇති වූ විට අදාළ තනතුරේ III පංතියේ තනතුරු සඳහා පත්කිරීම සලකා බලනු ලැබේ. මුල් පත්වීමේ සිට වසර දෙකක් මුල් පත්වීමේ ස්ථානයේ රැඳී සිටීම අනිවාර්යය වේ.

15. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉල්ලුම්පත්‍ර පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/සේවයෙන් පහකරන අතර, නැවත රජයේ සේවයට නොගන්නාවූන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

16. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික සහ මානසික වශයෙන් යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් පුහුණු පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

17. ඉහත පරිදි බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් රජයේ සේවකයන් ලෙස අදාළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් හා වෙනත් රෙගුලාසිවලටද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ටද යටත් වනු ඇත.

18. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත වුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

වෛද්‍ය රවීන්ද්‍ර රුබේරු,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2010 ක් වූ ඔක්තෝබර් මස වැනි දින,
සුවසිරිපාය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

### ආදර්ශ අයදුම්පත්‍රය

***සෞඛ්‍ය අමාත්‍යාංශය, වෛද්‍ය කර්මය සඳහාවූ පරිපූරක වෘත්තීය සේවාවේ ඖෂධවේදී පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම - 2010***

01. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. තැපැල් ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ..................... | ..................... |
| ..................... | ..................... |
| ..................... | ..................... |
| ..................... | ..................... |

04. (අ) ස්ථිර ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ..................... | ..................... |
| ..................... | ..................... |
| ..................... | ..................... |
| ..................... | ..................... |

(ආ) දිස්ත්‍රික්කය :————.

(ඇ) ඔබ මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත :——————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද? :————.

05. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

2010.12.15 වැනි දිනට වයසය : අවුරුදු :————. මාස :————. දින:——————.

06. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය : ☐ (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

ස්ත්‍රී - F
පුරුෂ - M

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

08. විවාහක/අවිවාහක බව :————.

09. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (උ. පෙළ) විභාගය (විද්‍යා විෂයන් පමණි) (ලකුණු සටහන් පිටපත් අමුණන්න)
විභාගයට ඉදිරිපත් වූ දිස්ත්‍රික්කය :————.
විභාගයේ වර්ෂය :————.
විභාග අංකය :————.
Z අගය :————.

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගය - පළමු වර
විභාගයේ වර්ෂය :————.
විභාග අංකය :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

අ. පො. ස. (සා. පෙළ) විභාගය - දෙවන වර
විභාගයේ වර්ෂය :————.
විභාග අංකය :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේ ද?

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

ඔව් නම් විස්තර සපයන්න. :————.

11. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවටත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී 2010 ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

11-311

**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2010

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2011 ජනවාරි මාසයේදී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේදී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සතු වේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ම මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාව.—*

(i) සෑම අපේක්ෂකයෙකුම ඔහු/ඇය :-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු බවත්,
(ආ) විශිෂ්ට චරිතයකින් යුත් අයකු බවත්,
(ඇ) ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 24 ට නොවැඩි බවත්, පිළිගත හැකි සාක්ෂිවලින් ඔප්පු කළ යුතු ය.

(ii) ශාරීරික යෝග්‍යතාවය :- පිරිමි අපේක්ෂකයෙකුගේ උස අඩි 5 අඟල් 5 කට අඩු නොවිය යුතු අතර, පපුව (ප්‍රසාරණය කළ විට) අඟල් 33 ට නොඅඩු විය යුතුය.

ගැහැණු අපේක්ෂිකාවන්ගේ උස අඩි 5 යි අඟල් 03 කට නොඅඩු විය යුතුය.

(iii) අධ්‍යාපන සුදුසුකම්.-අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ප්‍රධාන විෂයන් තුනකින් එකවර සමත්වීම;

*සහ*

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සහ (සාමාන්‍ය පෙළ) විභාගයේදී ප්‍රධාන විෂයන් වශයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව සම්මාන සාමාර්ථයන් පහක් ද, ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් සහිතව දෙවතාවකට නොවැඩි වර ගණනකදි විෂයන් 06 කින් එකවර සමත්විය යුතු ය.

03. *සේවා කොන්දේසි.—*

(i) *වැටුප් :* මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.
රා. ප./චලේ අංක : 6/2006 (iv) - RS— 5- 1-2006
රු. 14,280 - 145 x 7 - 180 x 10 - 240 x 17 = රු. 21,175

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(iii) තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන් විසින්, තමන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද, නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.

(v) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදීම සේවය කිරීමට සිදුවිය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතු ය.

(vi) මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත් කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. *විභාග පරිපාටිය* : බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ. :

| | | |
|---|---|---|
| (i) | අභියෝග්‍යතා පරීක්ෂණය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (ii) | ගණිතය (පැයි 01 යි) | ලකුණු 100 යි |
| (iii) | ඉංග්‍රීසි භාෂාව (පැය 01 1/2 යි) | ලකුණු 100 යි |
| | එකතුව | 300 යි |

*අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය* : මෙම ප්‍රශ්න පත්‍රයට අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ භාෂා ප්‍රවීණත්වය හා තර්කන ශක්තිය මැනීම සඳහා ප්‍රශ්න ඇතුළත් වේ.

*ගණිතය* : ගණිත හැකියාව මැනීම සඳහා සකස් වූවකි.

*ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය* : අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

**සටහන** : මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට මෙම නිවේදනයේ 02 (iii) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම (එනම්, සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන්) අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පෙනී සිටිය යුතු ය. කෙසේ වුව ද සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිට සමත් වූ අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට නැතහොත් දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපන ලද අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට තමා කැමති නම් මෙම විභාගයේ දී සිංහල භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය හැකි වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි අත් අකුරු ඇති අපේක්ෂකයින්/අපෙක්ෂිකාවන් විභාගයට නුසුදුස්සන් කරනු ලැබීමට ද ඉඩ ඇත.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කර ඇති අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැළකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iii) *ඇගයීමේ ක්‍රමය*.- තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 60%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව ලකුණු ලබා ගන්නා වැඩිම ප්‍රමාණයේ සිට පහළට එමින් පවත්නා පුරප්පාඩු අනුව අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහිදී, ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10 ක් ලබා දෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට යොමු කෙරේ. එහිදී අපේක්ෂයින්ට ලකුණු ලබාදීමක් සිදු නොවන අතර, විභාගයේදී ලබාගත් ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු පමණක් සැළකිල්ලට ගනු ලැබේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල* - කලාප මට්ටම් ක්‍රීඩා තරග ප්‍රථම ස්ථානයට ලකුණු 3 යි. දෙවන ස්ථානයට ලකුණු 2 යි. තුන්වන ස්ථානය ලකුණු 1 යි. දිස්ත්‍රික් මට්ටමේදී ප්‍රථම ස්ථානය ලකුණු 4 යි. දෙවන ස්ථානයට ලකුණු 3 යි. තුන්වන ස්ථානයට ලකුණු 2 යි. ජාතික මට්ටමට - පළමු ස්ථානයට ලකුණු 5 යි. දෙවන ස්ථානය ලකුණු 4 යි. තුන්වන ස්ථානයට ලකුණු 3යි.

05. *තෝරා ගැනීම පදනම* - ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලබන අතර, පුරප්පාඩුවලින් 10% කට නොවැඩි ප්‍රමාණයක් අපේක්ෂිකාවන් සඳහා වෙන් කෙරේ.

*සටහන* : රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ස්වභාවය අනුව කාන්තා නිලධාරීන්ටද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන්හි සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භරගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. *ඉල්ලුම් කිරීමේ පිළිවෙල*.—

(i) *ආදර්ශ අයදුම්පත* : මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම පිළියෙල කළ යුතු අතර, එය තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතු ය. අයැදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදි ම අයදුම්කරු විසින් පිරවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වේතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතුය. අයැදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේ ම සිහි තබා ගත යුතු ය. (ආදර්ශ අයැදුම්පත්‍රයේ 01 සිට 06 තෙක් ශීර්ෂ 1 වන පිටුවට ද, 07 සිට 11 තෙක් දෙවන පිටුවේ ද, ඉතිරිය තුන්වන පිටුවට ද, වන සේ ඒ 4 ප්‍රමාණයෙන් කඩදාසිවල සකස් කරන්න). ඉල්ලුම්පත්‍රය පිළියෙල කිරීමේ දී විභාගයෙ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

(ii) අයදුම්පත් 2010.12.15 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් විභාග "කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "විභාගයේ නම" පැහැදිළිව සඳහන් කළ යුතුය.

(iii) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක : 2003.02.13 යටතේ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග ගාස්තු වශයෙන් රුපියල් 400 ක මුදලක් ගෙවා ලබාගත් ලදුපතක් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබාගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂයින් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. 2010.12.15 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල් ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුව ද නියමිත දිනට පසුව ලැබුනහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. "දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව" තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

(v) *සහතික කිරීම.*- දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනිකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, නොතාරිස් කෙනෙකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක විදුහල්පතිවරයකු නාවික, ගුවන්, හෝ යුධ හමුදාවක කොමිෂන්ලත් නිලධාරියකු, රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු යන අයගෙන් කෙනෙකු විසිනි.

08. *විභාගයට ඇතුළත් කර ගැනීම.*- විභාග කොමසාරිස් ජනරාල් විසින් භාරගනු ලැබූ අයදුම්පත් වෙනුවෙන් ඒ ඒ අපේක්ෂකයින් වෙත ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් තමන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. එබඳු ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

අයදුම්කරුවන් තමන්ට නියම කර තිබෙන විභාග ශාලාවෙහි ම විභාගයට පෙනී සිටිය යුතු ය. තමාට නියම කර ඇති විභාග ශාලාව හැර වෙනත් විභාග ශාලාවකට පැමිණෙන කිසිම අපේක්ෂයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂයෙකු විසින්ම තමන් විභාගයට පෙනී සිටින දිනයෙහිම ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටස (IIඅ) ඡේදයෙහි විභාග අපේක්ෂකයින් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අපේක්ෂකයින් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු යි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍ර එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

09. *හැඳුනුම්පත්.*—අපේක්ෂකයින් විභාග ශාලව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය;

(ආ) මෙම විභාග දිනට අවුරුදු 05 කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. *සුදුසුකම් පිළිබඳ ලියවිලි :*

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ ලදුපත හැර වෙනත් කිසිදු ලිපි ලේඛනයක් නොඑවිය යුතු ය. එහෙත් නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම, විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතු ය. මෙසේ අවශ්‍ය වන කරුණු වලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් ලියකියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතු ය.

(iii) පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිවයුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

*සටහන.*—එම සහතිකය සමාදාන විනිශ්චයකාරවරයෙක් නීතිඥවරයෙක් පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන් වුවද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිළි ලෙස සඳහන්ව තිබිය යුතුය.

රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයින් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

*සටහන් :* (i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උධෘත භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා/අපේක්ෂිකාව සාමාන්‍යයෙන් භාවිත කරන, එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර, වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක : 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතු ය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි).

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරී ලියවිලි.

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවලදී දැක් වූ කුසලතා සම්බන්ධ ලේඛන.

(vi) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අපේක්ෂකයින්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අපේක්ෂකයකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සෙකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම.*—මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට, ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුව ද, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීම නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතුවනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

රේගු අධ්‍යක්ෂ ජනරාල්.

කොළඹ 01,
බ්‍රිස්ටල් වීදිය,
ටයිම්ස් මන්දිරය,
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2010***

Open Competitive Examination for Recruitment to Posts of Inspector of Customs, Grade II of Sri Lanka Customs Department

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මධ්‍යය : [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. අයදුම්කරුගේ නම :

1.1 මුල් කුරු අගට යොදා මුල් කුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා.- SILVA B. A.)

1.2 මුල් කුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුල් කුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
සිංහලෙන්/දෙමළෙන් :————.

02. ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර :

3.1 හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

3.2 නිකුත් කළ දිනය : [ ]

04. ස්ත්‍රී/පුරුෂභාවය : [ ]
පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ :
පරම්පරාවෙන් - 1
ලියාපදිංචියෙන් - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. ජනවර්ගය :
සිංහල 1
ලංකා දෙමළ 2
ඉන්දියානු දෙමළ 3
මුස්ලිම් 4
බර්ගර් 5 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
වෙනත් 6

07. උපන් දිනය :

(අ) අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ආ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

08. ශාරීරික යෝග්‍යතාව :
(i) උස : අඩි ............ අඟල් ............

(ii) පපුව (ප්‍රසාරණය කළවිට) : අඟල් ............
(පිරිමි අයදුම්කරුවන්ට පමණයි.)

09. ඔබ කවදා හෝ උසාවියකින් වැරදිකරුවකු වී තිබේද? ඔව්/නැත
"ඔව්" නම් විස්තර සඳහන් කරන්න. :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (උසස් පෙළ) පළමුවන වර : ☐
විභාගයේ වර්ෂය

විභාග අංකය : ☐

| විෂයයන් | සාමාර්ථ්‍යය | විෂයයන් | සාමාර්ථ්‍යය |
|---|---|---|---|
| | | | |
| | | | |

(ii) අ. පො. ස. (සා. පෙළ.) :

| විෂයයන් | සාමාර්ථ්‍යය | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සාමාර්ථ්‍යය | සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

(iii) අ. පො. ස. (සා. පෙළ.) ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා ඇත් ද? ඔව්/නැත. ☐

11. විභාග ගාස්තුව (පිටපත අමුණා එවිය යුතුය) :

දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
දිනය :————.
ලදුපත් අංකය :————.

(මෙහි සඳහන් විස්තර අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතුය.)

12. අයදුම්කරුගේ ප්‍රකාශය/සහතිකය ඃ

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කර තිබෙන සියලු විස්තර සත්‍ය බව ප්‍රකාශ කර මි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන

දිනය :————.

13. අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම : (අදාළ නොවන වචන කපා හරින්න).

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන .......................... නමැති මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය .......................... දෙපාර්තමේන්තුවේ/ මණ්ඩලයේ/ සංස්ථාවේ සේවයේ නියුතු අයකු බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය ......... මස ......... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

ඔහු/ඇය II වන ශ්‍රේණියේ රේගු පරීක්ෂක පත්වීමක් සඳහා තෝරාගත හොත් මෙම දෙපාර්තමේන්තුවේ/මණ්ඩලයේ/සංස්ථාවේ සේවයෙන් මුදාහැරිය හැකිය.

සහතික කරන්නාගේ අත්සන :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

සටහන : අයැදුම්පත සහතික කළ යුත්තේ ගැසට් නිවේදනයේ 7 (V) ඡේදයේ සඳහන් පරිදිය.

11-367

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009 (2010)**

ඉහත සේවාවේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2011 පෙබරවාරි මස ආරම්භ කොට පේරාදෙණියේ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2010 වසරේ ඔක්තෝබර් 01 දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටි නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකි වන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශ .—* I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග I සඳහා වූ විෂය නිර්දේශ ඇමුණුම "අ" හි ද කාර්යක්ෂමතා කඩඉම් II සඳහා වූ විෂය නිර්දේශය "ආ" හි ද සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය :-

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය

| *I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය* | | | *II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය* | | |
|---|---|---|---|---|---|
| *විෂය අංකය* | *විෂයය* | *කාල සීමාව (පැය)* | *විෂය අංකය* | *විෂයය* | *කාල සීමාව (පැය)* |
| 01 | මූල්‍ය ක්‍රම | 03 | 01 | කොටස් 01 | 03 |
| 02 | පරිපාලනය | 03 | 02 | කොටස් 02 | 03 |
| 03 | දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය - I | 02 | 03 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය I | 03 |
| 04 | දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය - II | 03 | 04 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය II | 03 |
| 05 | විශේෂ ප්‍රශ්න පත්‍රය* | 03 | 05 | කොටස් 03- ප්‍රශ්න පත්‍රය III | 03 |
| | | | 06 | කොටස් 03- ප්‍රශ්න පත්‍රය IV | 03 |
| | | | 07 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය V | 03 |
| | | | 08 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VI | 03 |
| | | | 09 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VII | 03 |
| | | | 10 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VIII | 03 |
| | | | 11 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය IX | 03 |
| | | | 12 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය X | 03 |
| | | | 13 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය XI | 03 |

* *මේ සඳහා අයැදුම් කළ යුත්තේ පශු පර්යේෂණ නිලධාරීන් පමණි.*

*සටහන.*—II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ අයදුම්කරුවන් පෙනී සිටිය යුත්තේ කොටස් 01 හෝ කොටස් 02 යන ප්‍රශ්න පත්‍ර දෙකින් එකකට හා 03 හි සඳහන් ප්‍රශ්න පත්‍ර XI න් ප්‍රශ්න පත්‍ර දෙකකට පමණි. සාමාර්ථ්‍යය සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතුය.

05. පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුල්වීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාවය.

06. පහත දැක්වෙන ප්‍රශ්නපත්‍රවලට සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් උත්තර සැපයීමට අපේක්ෂකයින්ට හැකිවනු සඳහා විභාග කොමසාරිස් ජනරාල් විධිවිධාන සලස්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) මූල්‍ය ක්‍රම
(ii) පරිපාලනය
(iii) දෙපාර්මේන්තු රෙගුලාසි I
(iv) දෙපාර්තමේන්තු රෙගුලාසි II

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර, අමුණා ඇති ආකෘතියට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතුය. **ඉහත සඳහන් පරීක්ෂණ දෙකටම පෙනී සිටින්නේ නම් වෙන වෙනම එක් එක් විභාගයන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.** ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුවේ. ඊට අදාල තොරතුරු තම අත් අකුරින්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුවේ. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත් අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. ඉල්ලුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. ඉල්ලුම්පත්‍ර 2010 නොවැම්බර් මස 26 වැනි දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂක ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ, පේරාදෙණිය."

11. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබාගෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සළකා බලනු නොලැබේ.

13. හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 1971 ජූනි මස 29 වැනි දින අංක එස්ඊ 274 දරන චක්‍රලේඛය කෙරෙහි සියළුම අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරනු ලැබේ. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වනු ඇත. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණකි.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත :

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා—

| | රු. | ශත |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | 400 | 0 |
| එක් විෂයකට | 200 | 0 |

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. මෙම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 292-1-1-2401ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට/දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක.

15. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

ඒ. එච්. ගමගේ,
ලේකම්,
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය.

2010 ඔක්තෝබර් මස වැනි දින,
අංක 45, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

***ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009 (2010)***

Efficiency Bar Examination for Officers in the Sri Lanka
Animal Production and Health Service — 2009 (2010)

(විභාගයේ නම ලිපිකවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)
(කාර්යක්ෂමතා කඩඉම් විභාග 02ටම එකවර පෙනී සිටින්නේ නම් ඒ සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර 02ක් එවිය යුතුය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

☐ (අදාල අංකය කොටුව තුළ ලියන්න.)

නිලධාරියා ඉල්ලුම්කරන විභාගය :

☐ (අදාල අංකය කොටුව තුළ ලියන්න.)

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 1
දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2

01. (අ) මුල’කුරු අගට යොදා මුල’කුරු සමඟ නම :———.
(උදා :-Nimalsiri K.A.)

(ආ) මුල’ අකුරුවලින් හැඳින්වෙන නම් :———.

02. උපන් දිනය :- වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

03. පදවි නාමය :———.
දෙපාර්තමේන්තුවේ නම :———.

04. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා):———.

05. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත් කරන ලද දිනය :———.

06. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිළිව සඳහන් කළ යුතුය.)

(i) විෂය අංකය : ☐☐ විෂයය :———.
(ii) විෂය අංකය : ☐☐ විෂයය :———.
(iii) විෂය අංකය : ☐☐ විෂයය :———.
(iv) විෂය අංකය : ☐☐ විෂයය :———.
(v) විෂය අංකය : ☐☐ විෂයය :———.

07. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විෂයයන්ද වර්ෂය හා මාසයද සඳහන් කරන්න. :———.

08. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහලින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

09. ගෙවන ලද විභාග ගාස්තුව : රු. :

ලදුපත ඇලවීම සඳහා
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

———,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :———.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින්
විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

* අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවද සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
පදවි නාමය.

දිනය :———.

(*ගාස්තුව නොගෙවන විටදී කපා දැමිය යුතුය)

"අ" ඇමුණුම

(අ) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :—

1. මූල්‍ය ක්‍රම;
2. පරිපාලනය;
3. දෙපාර්තමේන්තු රෙගුලාසි - I
4. දෙපාර්තමේන්තු රෙගුලාසි - II

1 මූල්‍ය ක්‍රමය

මූල්‍ය ක්‍රම පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :-

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය ( x වැනි පරිච්ඡේදය හැර)
(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තුගත (උදා : ඒවා සකස් කිරීම ශීර්ෂ මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්)

(ඈ) කච්චේරි මගින් විශේෂයෙන් කරගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥාපනත්

* සටහන : සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

2 පරිපාලනය

පරිපාලනය පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :-

(අ) කාර්යාල හා ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම
(ආ) ආයතන සංග්‍රහය : පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

3 දෙපාර්තමේන්තු රෙගුලාසි - I

දෙපාර්තමේන්තු රෙගුලාසි පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :—

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන්ගෙන් සමන්විත පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි. සත්ත්ව පනත යටතේ ඇති ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා වූ ආඥාපනත, සත්ත්ව පනත, දෙපාර්තමේන්තු නියෝග හා පශු වෛද්‍ය සේවයට අදාළ චක්‍රලේඛ.

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

4 දෙපාර්තමේන්තු රෙගුලාසි - II

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන්ගෙන් සමන්විත පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි :—

(අ) නිදර්ශක බෙදාහැරීම, පශ්චාත් මරණ පරීක්ෂණ ඇතුළු රසායනාගාර හඳුනාගැනීම්, ගැබ් පරීක්ෂාව ඇතුළු හඳුනාගැනීම් පරීක්ෂණ, බෝවන රෝග, ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා එන්නත් හා මස්තු පරීක්ෂාව;

(ආ) කෘත්‍රිම සිංචන ක්‍රමවේදය හා එහි භාවිතය, වසුපැටවුන් බෝකිරීම හා ඇතිදැඩි කිරීමේ මූලධර්ම, බීජෞෂනය මගින් පැටවුන් ලබාගැනීම හා ඇතිදැඩිකිරීම, සත්ත්ව පෝෂණය, පශු සම්පත් සඳහා ආහාර වේල හා එහි භාවිතය, පෝෂ්‍ය තෘණ වගාව, වියළි තෘණ සහ සයිලේජ් සැකසීම හා පශු සම්පත් කළමනාකරණය;

(ඇ) කිරි නිෂ්පාදනය, පැස්චරීකරණය කරන ලද කිරි බෝතල් කිරීම හා ප්‍රවාහනය, කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත බව, කිරිවල බැක්ටීරියා, මේදය, කිරි විශ්ලේෂණය ඇතුළුව පරීක්ෂා කිරීම, යොදය වෙන් කිරීම, බටර්, ගිතෙල් හා මී කිරි නිෂ්පාදනය;

(ඈ) ඝාතනාගාර, සතුන් ඝාතනය කිරීම, මාංශ හඳුනාගැනීම් ඇතුළුව මාංශ පරීක්ෂා කිරීම.

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

ඇමුණුම "ආ"

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ II වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :—

1 කොටස : මෙම විෂය නිර්දේශයේ, 2 : 1, 2 : 2, 4 : 1, 4 : 2, 5 : 2, 5 : 8, 6 : 5, 7 : 2 : 1, 8 : 2, 8 : 2 : 2, 8 : 2 : 3, 8 : 3 : 1, 9 : 2, 9 : 4, 9 : 6, 9 : 7 කොටස්වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගත හැකිය.

2 කොටස : මෙම විෂය නිර්දේශයේ 1 : 1 : 1, 1 : 1 : 4, 1 : 2 : 1, 3 : 2, 3 : 1 : 1, 3 : 1 : 2, 3 : 2 : 1, 10 : 1 : 1, 10 : 1 : 2, 10 : 1 : 3, 10 : 1 : 4, 10 : 1 : 6, 10 : 2 : 1, 10 : 2 : 8 හා 10 : 4 : 1 කොටස්වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන් ගෙන් ලබා ගත හැකිය.

| | | | |
|---|---|---|---|
| 3 කොටස : | 1 පත්‍රය | - | ව්‍යාධි විද්‍යාව |
| | 2 පත්‍රය | - | පශු සම්පත් ආර්ථික විද්‍යාව |
| | 3 පත්‍රය | - | පශු මහජන සෞඛ්‍යය |
| | 4 පත්‍රය | - | කෘෂි ව්‍යාප්තිය |
| | 5 පත්‍රය | - | ජාන විද්‍යාව හා අභිජනනය |
| | 6 පත්‍රය | - | සත්ත්ව කායික විද්‍යාව හා ප්‍රජනනය |
| | 7 පත්‍රය | - | සත්ත්ව නිවාසකරණය හා කළමනාකරණය |
| | 8 පත්‍රය | - | සත්ත්ව පෝෂණය |
| | 9 පත්‍රය | - | තෘණ හා ගෝචර තෘණ |
| | 10 පත්‍රය | - | ව්‍යවහාරික පශු ක්ෂුද්‍රජීව විද්‍යාව හා ප්‍රතිශක්තිකරණ විද්‍යාව |
| | 11 පත්‍රය | - | ව්‍යවහාරික, වෛද්‍ය විද්‍යාව, ව්‍යාධිවේදය හා පරපෝෂිතවේදය |

විස්තර පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබා ගත හැකිය.

11-175

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.